Australian Government

BE COVIDSAFE

# කෝවිඩ්-19: රෝග ලක්‍ෂණ හඳුනා ගැනීම

| රෝග ලක්‍ෂණ | කෝවිඩ්-19<br>රෝග ලක්‍ෂණ සාමාන්‍ය සිට දරුණු | සෙම්ප්‍රතිශ්‍යාව<br>ක්‍රමානුකූලව රෝග ලක්‍ෂණ ඇතිවීම | උණ<br>එක්වර රෝග ලක්‍ෂණ ඇතිවීම | අසාත්මිකතා*<br>රෝග ලක්‍ෂණ එක්වර හෝ ක්‍රමානුකූලව ඇතිවීම |
|---|---|---|---|---|
| උණ | බහුලයි | කලාතුරකින් | බහුලයි | නැත |
| කැස්ස | බහුලයි | බහුලයි | බහුලයි | බහුලයි (ඇදුම) |
| උගුරේ ආසාදන | සමහර අවස්ථාවල | බහුලයි | සමහර අවස්ථාවල | සමහර අවස්ථාවල (උගුර හෝ තල්ල කැසීම) |
| හුස්ම කෙටිවීම | සමහර අවස්ථාවල | නැත | නැත | බහුලයි (ඇදුම) |
| වෙහෙසකර බව | සමහර අවස්ථාවල | සමහර අවස්ථාවල | බහුලයි | සමහර අවස්ථාවල |
| වේදනා | සමහර අවස්ථාවල | නැත | බහුලයි | නැත |
| හිසරදය | සමහර අවස්ථාවල | බහුලයි | බහුලයි | සමහර අවස්ථාවල |
| නාසයෙන් සොටු ගැලීම හෝ සිරවී ඇති බව | සමහර අවස්ථාවල | බහුලයි | සමහර අවස්ථාවල | බහුලයි |
| පාචනය | කලාතුරකින් | නැත | සමහර අවස්ථාවල, විශේෂයෙන් දරුවන් අතරේ | නැත |
| කිවිසීම | නැත | බහුලයි | නැත | බහුලයි |

*WHO; the US Centers for Disease Control and Prevention සහ the American Academy of Allergy, Asthma and Immunology. මගින් සම්පාදනය කල කරුණු අනුව අනුවර්තනය කරන ලදී. *අසාත්මික ශ්වසනයට අසාත්මික රයිනයිටස් (පීනස) සහ අසාත්මික ඇදුම ඇතුලත්වේ. පීනසේ වෙනත් බහුල රෝග ලක්‍ෂණ අතරට නාසය කැසීම සහ ඇස්වලින් කඳුළු වැගිරීම සහ ඇස් කැසීම ඇත. ඔබට බෝවන රෝග හෝ ශ්වසන රෝග සම්බන්ධ රෝග ලක්‍ෂණ (උගුරේ ආසාදන, හිසරදය, උණ, ඇතිනම්, හුස්ම කෙටිවීම, මාංශ පේශි වේදනා, කැස්ස හෝ නාසයෙන් සොටු ගැලීම ආදී) ඇතිනම්, වැඩට යන්න එපා. ඔබ ස්වයං හුදෙකලාවී, වෛද්‍ය වෘත්තීකයෙකු විසින් ඇගයීමක් කල යුතුය. කෝවිඩ්-19 සම්බන්ධ පරීක්‍ෂණයක් කරවා ගත යුතුය. වෛද්‍ය වෘත්තීකයෙකු විසින් අවසර ලබා දෙන තෙක් වැඩට යාම නොකල යුතුය. ඔබ විසින් රැකවරණය ලබාදෙන අය ආරක්‍ෂාකාරී සහ සුරක්‍ෂිත බවට ඔබ විසින් වග බලා ගත යුතුය. අසාත්මික රයිනයිටිස් (පීනස) සහ අසාත්මික ඇදුම ආදී ශ්වසන අසාත්මික රෝග ලක්‍ෂණ ඇති අය අනපේක්‍ෂිත රෝග ලක්‍ෂණ, සාමාන්‍ය අවස්ථාවලට වඩා වෙනස් රෝග ලක්‍ෂණ හෝ වෙනදා භාවිතා කරන බෙහෙත්වලට ප්‍රතිචාර නොදෙන අවස්ථාවල, රෝග ලක්‍ෂණය ඇතිවන විගසම නිවසේ රැදී සිට කෝවිඩ්-19 සම්බන්ධයෙන් පරීක්‍ෂා කරවා ගත යුතුවේ.*

කොරෝනා වයිරස් (කෝවිඩ්-19) සම්බන්ධ වැඩි විස්තර සඳහා **health.gov.au** වෙබ් අඩවිය වෙත පිවිසෙන්න. **www.health.gov.au/resources/translated** වෙබ් අඩවිය වෙත පිවිසෙන්න, නැතිනම් භාෂා පරිවර්තන සහ තෝල්ක සේවා සඳහා **131 450** අමතන්න.

DTDT0001045